*Office of the Vice-Chancellor*

*University of Peradeniya*

වෙත : නියෝජ්‍ය උපකුලපති
පීඨාධිපතිවරුන්
ලේඛකාධිකාරී (වැඩබලන)
පුස්තකාලයාධිපති
මූල්‍යාධිකාරී
පරිපාලන මූල්‍ය නිලධාරීන් හා විධායක නිලධාරීන්
අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපන
වැඩ බලන ප්‍රධාන වෛද්‍ය නිලධාරී
වැඩ ඉංජිනේරු
ප්‍රධාන ආරක්ෂක නිලධාරී
උද්‍යාන පාලක

මගින් : වැඩබලන ලේඛකාධිකාරී

වෙතින් : උපකුලපති

දිනය : 2022.12.12

**<u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය (විධායක නොවන) විශිෂ්ටතා සම්මාන - 2022</u>**
**<u>පේරාදෙණිය විශ්වවිද්‍යාලය</u>**

විශ්වවිද්‍යාල පරිපාලනය විසින් සේවකයින්ගේ සේවය අගයමින් මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (විධායක නොවන) සඳහා වාර්ෂිකව " විශිෂ්ඨතා සම්මාන " ප්‍රදානය කිරීමට තීරණය කර ඇති බව ඔබ වෙත සතුටින් දන්වා සිටිමි.

ඒ අනුව, 2022 වසරේ තම තනතුරෙහි ප්‍රශංසනීය අයුරින් සාර්ථකව කටයුතු කළ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2023.01.02 දින ඇගයීමට ලක් කෙරෙන අතර විවිධ තනතුරු කාණ්ඩ යටතේ (තාක්ෂණ නිලධාරීන්, කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික ශ්‍රේණි) මේ සඳහා සුදුසුකම් ලබන සේවක භවතුන් තෝරා ගැනීම සිදු කෙරේ.

මෙම ඇගයීමේ ක්‍රියා පටිපාටිය ප්‍රථම වරට සිදුකරන බැවින් මෙම වසරේ දී අප විසින් ඉහත සඳහන් තනතුරු වල උනන්දුවක් දක්වන සේවක මහත්ම මහත්මීන්ගේ අයදුම්පත් කැඳවීමට සැලසුම් කර ඇති අතර නිශ්චිත ලකුණු දීමේ පටිපාටියක් සහිතව ස්වාධීන ඇගයීම් මණ්ඩලයක් විසින් ඔවුන් ඇගයීමට ලක් කෙරේ. මෙහි ඉහළම ලකුණු ලබා ගන්නා 1% සඳහා මුදල් ත්‍යාගයක් හිමිවන අතර ඉහළම ලකුණු ලබා ගන්නා 5% තුළ සිටින සියලුම සේවක මහත්ම මහත්මීන් හට ඇගයීමේ සහතිකයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව මෙම ඇගයීම සඳහා වන අයදුම්පත්‍රය මේ සමඟ අමුණා ඇති අතර, එම අයදුම්පත **https://www.pdn.ac.lk/** විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ද භාගත කල හැකිය. නිසි පරිදි පුරවන ලද අයදුම්පත් (දෘඩ පිටපත) අදාල සියලු සහතික වල පිටපත් ද සහිතව **2022.12.20** දින හෝ ඊට පෙර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා නියෝජ්‍ය ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන වෙත ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි. (දෘඩ පිටපත දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා අනධ්‍යයන ආයතන අංශයට යොමු කරන තුරු අයදුම්පත්‍රවල මෘදු පිටපත **nacest@gs.pdn.ac.lk** වෙත යොමු කළ හැක). ප්‍රමාද වූ අයදුම්පත් සහ අදාල සහතික වල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.

ඒ සඳහා අයදුම් කිරීමට ඔබගේ පීඨයේ/දෙපාර්තමේන්තු/අංශයේ අදාළ සියලුම අනධ්‍යයන සේවකයන් දැනුවත් කරන ලෙස මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමි.

උපකුලපති

උප කුලපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය
ශ්‍රී ලංකාව